කුරුණෑගල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශුද්ධ වත්කම් වල අඩුවීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම්වල තත්ත්වය රු.109,481,721 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු.124,517,730 ක් වීමෙන් ශුද්ධ වත්කම්වල රු.15,036,009 ක අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි රු.986,403 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.

(ආ) 1999 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කරගෙන තිබුණු ඉඩම් 41 ක් හා ගොඩනැගිලි 05 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂය තුළ රජයේ පරිත්‍යාග වශයෙන් සභාව වෙත ලැබී තිබුණු ජේ.සී.බී යන්ත්‍රය, කැබ් රථ 02 ක් හා ට්‍රක් රථයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2016 මාර්තු 09 දින සභාව විසින් වටිනාකම රු.87,500 ක් වූ අත්ට්‍රැක්ටරයක් විකුණා ඇති අතර එම ඉවත් කිරීම වෙනුවෙන් රු.77,962 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම හරකර මෝටර් රථ හා කරත්ත ගිණුම බැරකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේදී මෝටර් රථ හා කරත්ත ගිණුමේ වටිනාකම රු.22,541,228 ක් තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සභාවේ නොමැති රු.447,721 ක් වටිනා කසල කරත්ත තොගයේ වටිනාකමද, ස්ථාවර වත්කම් ලේඛනය තුළ නොමැති රු.3,218,395 ක් වූ ට්‍රැක්ටර් 03 ක වටිනාකම හා රු.392,312 ක් වටිනා ට්‍රේලර් 03 ක වටිනාකමද ඇතුළත්ව තිබුණු අතර ඉන්වෙන්ට්‍රි ලේඛනය තුළ ඇතුළත්ව තිබුණු රු.24,800 ක් වටිනා කසල කරත්තයක වටිනාකම මෝටර් රථ හා කරත්ත ගිණුම තුළ ඇතුළත් නොවුණි.

(ඊ) 2015 දෙසැම්බර් මාසයේ කාර්යය මණ්ඩල වැටුප් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.3,598,848 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී හිඟහිටි වැටුප් ප්‍රතිපූර්ණ පාලන ගිණුමේ ශේෂය වූ රු.10,681,959 ක් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් ප්‍රමාණය රු.7,083,111 කින් වැඩිපුර දක්වා තිබුණි.

(උ) වර්ෂයේ ආරම්භක ශේෂය රු.98,748,043 ක් වූ විවිධ ණයගැති කර්මාන්ත ගිණුමේ ශේෂයෙන් රු.44,621,579 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අනුමැතියකින් තොරව ජර්නල් අංක 40 මඟින් සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

**1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 13 කට අදාලව පැවති ශේෂයන් හා ඒවාට අදාල උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර එකතුව රු. 58,664,910 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 60,162,707 ක් විය. එහි වසර 03 කට වැඩි කාලයක සිට නිරවුල් නොවූ රු.34,493,982 ක ශේෂයන් ඇතුළත්ව පැවති අතර එයින් මූල්‍ය ප්‍රකාශන දින වන විට රු. 3,866,350 ක ශේෂයක් අයවී තිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට පැවති ලැබිය යුතු ගිණුම් ශේෂ වටිනාකමින් ආසන්න වශයෙන් සියයට 67 ක් හෙවත් රු. 40,460,547 ක් විවිධ ණයගැතියන් වූ අතර මින් රු.33,469,765 ක් වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂ වන අතර ඒවා ලැබිය යුත්තේ කුමන පාර්ශවයන්ගෙන්දැයි හඳුනාගත නොහැකි වී තිබුණි. තවද රු.1,113,628 ක අත්තිකාරම් ශේෂයෙන් රු.854,036 ක් වර්ෂ ගණනාවක සිට පැවත එන සභාව විසින් නිරවුල් කරගෙන නොමැති ශේෂයක් විය.

1.3.5 <u>ගෙවිය යුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.78,580,886 ක් වූ අතර තොරතුරු ඉදිරිපත් වූ රු. 30,849,517 ක ශේෂය තුළ වසර 03 ඉක්මවූ නිරවුල් නොවූ රු.10,189,479 ක ශේෂ පැවතුණි. මූල්‍ය ප්‍රකාශන විගණිත දිනය වන විට මෙම හිඟ ශේෂයෙන් රු. 9,586,671 ක් අයවී පැවතුණි.

(ii) ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වූ රු.26,317,503 ක් කර්මාන්ත ණය හිමියන් වූ අතර මෙයින් රු.10,160,976 ක් වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂ වන අතර ණයහිමි පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

(iii) ගෙවිය යුතු ගිණුම් ශේෂ තුළ දීර්ඝ කාලයක සිට පවතින විවිධ තැන්පතු ශේෂවල වටිනාකම රු.47,731,366 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 60 ක් විය. තවද මෙම ශේෂයෙන් රු.17,620,903 ක් හඳුනාගෙන නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.75,512,416 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව ශේෂ සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් සතුටුදායක ලෙස විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.7 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත නීති රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ දින සිට මාස 06 ක් ඉක්මවූ රු.35,480 ක් වූ වටිනා චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2014 ඔක්තෝබර් 01 දිනැති අංක 1882/22 දරන නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීමට අදාල අතුරු ව්‍යවස්ථාවේ | |
| (i) 2015 ජනවාරි 20 දින සංශෝධිත 03 2(අ) වගන්තිය | හෙක්ටයාර් 02 වැඩි පොල් ඉඩමක් කට්ටි කිරීමේදී ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේද අනුමැතියක් ලබා ගතයුතු වුවද, කොස්ගහමුල්ල වත්ත ඉඩම, ඉඩම්ගහපොල පිහිටි ලෙව්වම් වත්ත ඉඩම, ආඳාගල කන්ද ඉඩම්වල කට්ටි සැලසුම් වලට (A 9163 හා 9165) පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව සභාව විසින් අනුමැතිය ලබාදී තිබුණි. |
| (ii) 14 (2) වගන්තිය | විකුණුම්කරුගෙන් ඉඩම් විකිණීම සම්බන්ධයෙන් ත්‍රෛමාසික වාර්තාවක් ලබාගැනීමට කටයුතු නොකිරීම මත සභාව විසින් ඇස්තමේන්තු විකුණුම් මත සියයට 1 බදු මුදල අයකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,327,915 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,591,470 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,736,445 ක වර්ධනයක් දක්නට ලැබුණි. එම මූල්‍ය ප්‍රතිඵලයට රු.8,884,734 ක් වූ ප්‍රාග්ධන ලැබීම් සහ රු.28,668,152 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.18,544,497 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 21,090 | 23,715 | (2,625) | පෞද්ගලික පඩිනඩි | 53,700 | 46,268 | 7,432 |
| (ii) | වෙනත් | | | | | | | |
| | උප එකතුව | 121,350 | 102,254 | 19,096 | අනෙකුත් | 50,412 | 57,110 | (6,698) |
| | | 142,440 | 125,969 | 16,471 | උප එකතුව | 104,112 | 103,378 | 734 |
| (iii) | ප්‍රාග්ධන | | | | | | | |
| | මුළු එකතුව | 8,885 | 63,762 | (54,877) | ප්‍රාග්ධන | | | |
| | | 151,325 | 189,731 | (38,406) | වියදම | 28,668 | 89,518 | (60,850) |
| | | | | | මුළු එකතුව | 132,780 | 192,896 | 60,116 |
| | පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම | 38,328 | 22,591 | 15,737 | අතිරික්තය/ ඌනතාවය | 18,544 | (3,165) | 21,709 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.142,440,126 න් සියයට 85 ක් හෙවත් රු.121,350,063 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.8,884,734 ක මුළු ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.104,112,210 න් සියයට 52 ක් හෙවත් රු.53,699,901 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 75 ක් හෙවත් රු.40,218,192 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.28,668,151 න් සියයට 19 ක් හෙවත් රු.5,563,563 ක් පමණක් සභා අරමුදල් වූ අතර ඉතිරි සියයට 81 ක් හෙවත් රු.23,104,588 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත වී තිබුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා පිහිටුවීමට පෙර මල්ලවපිටිය ප්‍රදේශයේ පොලක් ඉදි කිරීම සඳහා සභාව නමින් කුරුණෑගල දිසාපති කාර්යාලයේ තැන්පත් කර තිබූ රු. 130,000 ක් ස්ථාවර තැන්පතු යටතේ ඉදිරියට ගෙන එමින් පැවතියද එකී ශේෂයේ අයිතිය හා පැවැත්ම පිළිබඳ තහවුරුවක් නොවීය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඕවර්සියර්ගේ ක්ෂේත්‍ර ගබඩා ලෙස රු. 28,645 ක ශේෂයක් පැවතුණි.

(ඇ) 1999 වර්ෂයේදී පළාත් පාලන සේවක මහා සංගමයට සියයට 2.5 ක පොලිය මත ලබා දී තිබූ රු.100,000 ණය මුදල අදාල ගිවිසුම අනුව වසරකට පසුව පියවන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට අදාල ගිවිසුම් කාලය නිම වී වසර 15 කට ආසන්නව පැවති අතර පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි වේ.

| | ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තුගත | 2015 තථ්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තුගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 10,990 | 10,668 | 11,012 | 9,336 | 7,481 | 10,004 |
| (ii) | බදුකුලී | 4,952 | 1,437 | 221 | 4,285 | 2,060 | 193 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,989 | 513 | - | 1,725 | 2,247 | 49 |
| (iv) | වෙනත් ආදායම් එකතුව | 127,894 | 129,822 | (559) | 99,811 | 118,801 | - |
| | | 146,825 | 142,440 | 10,674 | 115,157 | 130,589 | 10,246 |

### 2.4.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම | එකතුව | ආදායම් රැස් කිරීම | | | හිඟහිටි ශේෂය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට ගණනය කිරීම් අනුව මුළු හිඟය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 10,004 | 10,666 | 20,670 | 2,324 | 7,334 | 9,658 | 7,680 | 3,332 | 11,012 |
| බදු කුලී | 193 | 1,459 | 1,652 | 193 | 1,238 | 1,431 | - | 221 | 221 |
| බලපත්‍ර ගාස්තු | 49 | 510 | 559 | 49 | 510 | 559 | - | - | - |
| වෙනත් ආදායම් | - | 127,894 | 127,894 | - | 128,453 | 128,453 | - | (559) | (559) |
| එකතුව | 10,246 | 140,529 | 150,775 | 2,566 | 137,535 | 140,101 | 7,680 | 2,994 | 10,674 |

### 2.4.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයේදී වරිපනම් හා බදු හිඟය රු.10,003,807 ක් වූ අතර එම හිඟ වටිනාකමින් 2015 වර්ෂය තුළදී අය කරගෙන තිබුණේ රු.2,323,757 ක් ලෙස සියයට 23 ක් පමණි. 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන රීති) 32 – 42 දක්වා වූ රීති ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අය කිරීමේ ක්‍රියාවලිය සිදු කළයුතු වූවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

### 2.4.4 බදු කුලී

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු දේපල 9 ක් වසර 05 කට වැඩි කාලයක් තුළ බදු දී නොතිබූ අතර මෙම භූමියන්හි ලබාගත් පොල් එළදාවේ ආදායම් කිසිවක් සභාවට ලැබී නොතිබුණි.

(ආ) සභාව සතු බෝයගනේ වෙළඳපොලෙහි කඩ කාමර 06 ක් සඳහා වර්ෂ 05 කට වැඩි කාලයක් තුළ බදු ලබාදී නොතිබූ අතර එම කඩ කාමර යොදාගත් කාර්යයන් පිළිබඳ නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.4.5 බලපත්‍ර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයට දැන්වීම් පුවරු ගාස්තු ලෙස රු.40,600 ක මුදලක් පාර්ශවයන් දෙකකින් අයකර ගෙන නොතිබුණි.

(ආ) සභාබල ප්‍රදේශයේ පැවති ආදායම් නිලධාරීන් විසින් හඳුනා ගන්නා ලද සන්නිවේදන කුළුණු 06 ක් වෙනුවෙන් 2009 අප්‍රේල් 17 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 1597/8 අති විශේෂ ගැසට් නිවේදනය අනුව මේ දක්වා කිසිදු ආදායමක් අය කරගෙන නොතිබුණි.

### 2.4.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.32,774,152 ක් වුවද, මුද්දර ගාස්තු ලේඛනය අනුව 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.34,356,915 ක මුද්දර ගාස්තු හිඟව පැවතුණි.

(ආ) 2013, 2014 හා 2015 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණයන් හඳුනාගෙන මුද්දර ගාස්තු ලේඛනයේ වාර්තා කර නොතිබු අතර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා වූ මාස 07 ට අදාල ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු සභාව විසින් උසාවි දඩ ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ සහ වාහන සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛන හා ඉන්වෙන්ට්‍රි ලේඛනවල වර්ෂය තුළ එකතු කිරීම් හා අඩු කිරීම් ඇතුලත් කර යාවත්කාලීනව පවත්වා ගොස් නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.38,975 ක් වූ අගරු චෙක්පත් 04 හඳුනාගෙන නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.9,155 ක් වූ මාර්ගස්ථ ප්‍රේෂණ 04 හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් බැංකු සැසඳුමෙහි පවතින මුදල් පොතේ බැංකු ශේෂය හා බැංකුවේ ශේෂය අසමාන වීමට හේතුවක් ලෙස රු.7,125 ක් තොරතුරු සෙවීම අපහසු ලෙස දක්වා තිබුණු නමුත් එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට පැවත එන නිලධාරීන් 19 දෙනෙකුගෙන් අය කරගත යුතු එකතුව රු.82,625 ක සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2015 මාර්තු 27 දින අනුමැතිය ලබා දී තිබුණු අක්කර 8 යි පර්චස් 39.5 ක් වූ ඉඩම්ගහ පොළ පිහිටි ලෙව්වම් වත්ත ඉඩම වෙන්දේසි කිරීමේදී කට්ටි කරන ලද ඉඩම් සඳහා 2016 ජූනි වන විටද විදුලිය සහ ජල පහසුකම් ලබාදී නොතිබුණු අතර සභාවට පවරා දෙනු ලැබූ කැබලි අංක 39 ඉඩම් කොටසින් අඩි 20 දිග අඩි 15 ක් පමණ පළල ඍජුකෝණාකාර වලක් කපා අතුරු මාර්ග සංවර්ධන කටයුතු සඳහා පස් ලබාගෙන තිබුණි.

(උ) ගැට්ටුවාන ග්‍රාමයේ පිහිටි ආඳාගල කන්දේ අක්කර 07 හෙවත් හෙක්ටයාර් 2.8328 කින් යුතු දෙවන කොටස සඳහා 2015 මැයි 12 දින එනම් සභාව විසුරුවා හැරීමට ආසන්නම දිනක අදාල අතුරු ව්‍යවස්ථාවට පටහැනිව කිසිදු සංවර්ධන කටයුත්තක්ද සිදුකර නොතිබියදී ඉඩම් කැබලි 50 කින් යුතුව ඉදිරිපත් කරන ලද අනු බෙදුම් සැලැස්ම අනුමත කර තිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත හා තත්‍ය කාර්යය මණ්ඩලය පහත පරිදි විය.

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 116 ක් වූ අතර ස්ථිර සේවක සංඛ්‍යාව 124 ක්ද, පුරප්පාඩු 23 ක් හා අතිරික්ත සේවකයින් 20 ක් විය. අතිරික්ත සේවකයින් මුළු ප්‍රමාණයම සංවර්ධන නිලධාරීන් වූ අතර පුස්තකාලාධිපති තනතුරු 04 න් 03 ක් පුරප්පාඩුව පැවතුණි.

## 04 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සභාවේ උත්පාදිත ආදායම් යටතේ අය විෂයයන් 04 ක් යටතේ ඇස්තමේන්තුගත ආදායම රු.31,724,146 ක් වූ අතර අයකරගෙන ඇති ආදායම රු.18,470,818 ක් විය.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) අයවැය පාලනය